ශ්‍රී ලංකා මානව හිමිකම් කේන්ද්‍රය
இலங்கை மனித உரிமைகளுக்கான நிலையம்
Center for Human Rights & Research (CHR)

2026 මැයි 26

ආර්ථික නිවේදනය

## රැවටෙන්න එපා!

## මහ බැංකුවට විවෘත ආරාධනයක්. කටුවෙන් එළියට ඇවිත් උත්තර දෙන්න.

රැවටෙන්න එපා! ශ්‍රී ලංකා මහ බැංකුව 2026 මැයි 25 දින වාක්‍ය දෙකකින් යුතු නිවේදනයක් නිකුත් කර ඇත. එය ශ්‍රී ලංකා මානව හිමිකම් කේන්ද්‍රයේ පුවත්පත් නිවේදනයට දැක්වූ ප්‍රතිචාරයකි. මෙයට මාස 9 කට පෙර ද මහ බැංකුව 'රැවටෙන්නට එපා!' සමාජ මාධ්‍ය දැන්වීමක් පළ කළේය.

ෆ්‍රී ලෝයර්ස් සංවිධානය විසින් භාණ්ඩාගාර මංකොල්ලය සිදු කර දින 35 ක් ගතවී ඇති නමුත් ශ්‍රී ලංකා මහ බැංකුව ඒ පිළිබඳව හෝ තම අධීක්ෂණය යටතේ ඇති ක්‍රියාකාරකම් ගැන පැහැදිලි කිරීමක් සිදු කර නැත.

මෙයට පෙර 2015 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර මගඩිය අවස්ථාවේ දී ඒ පිළිබඳ අනාවරණය කළේ ද, අර්ජුන මහේන්ද්‍රන් දෙවන වාරය සඳහා අධිපති ධූරයට පත් කිරීම වැලැක්වීමට නඩු පවරනු ලැබූවේ දී රජිත් කීර්ති තෙන්නකෝන් විසිනි.

2021 දී අජිත් නිවාඩ් කබ්රාල් මහ බැංකු අධිපති ධූරයට පත් කිරීමට වැලැක්වීමට රජිත් කිර්ති තෙන්නකෝන් විසින් නඩු පවරනු ලැබූ නමුත් නීතිපතිවරයා එයට විරුද්ධ වූයේය.  2022 දී මුදල් අච්චු ගැසීම පිළිබඳ මාගේ නිවේදනයටත් එදා  මහ බැංකුව 'රැවටෙන්න එපා' යැයි කී අතර එයින් දින 100 කටත් අඩු කාලයක් තුල රට බුන්වත් භාවය (Bankruptcy)  ප්‍රකාශයට පත් කළේය.  කබ්රාල් මහතා විදේශගතවීම වැලැක්වීම වැලැක්වීමට අධිකරණ නියෝගයක් ගනු ලැබුවේ රජිත් කීර්ති තෙන්නකෝන් විසිනි.

අප සංවිධානයේ පුවත්පත් නිවේදනයේ දැක්වෙන  කරුණු 15 කට මහ බැංකුව ඍජු හා විශ්වසනීය පිළිතුරු ලබාදී නැත.  ඩො.මි. 2.5 සිද්ධියෙන් පසුව අතිගරු ජනාධිපතිතුමන් පාර්ලිමේන්තුවට නොපැමිණි ලෙසම, මුදල් ලේකම් මාධ්‍ය මඟහරින ලෙසම, මහ බැංකුව ද විෂයගත කරුණට නිශ්චිත කරුණු දැක්වීම් සිදු කරන්නේ නැත.

1. රැවටෙන්න එපා! 2025 ජනවාරි මස රු. බිලියන 14,439.1 ක් වූ  ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b), 2026 මාර්තු වන විට රු. බිලියන 16,585.7 දක්වා  රු. බිලියන 2,146.1 (ට්‍රිලියන 2.1) කින්

ප්‍රසාරණය වී ඇත. එහි බලපෑම මේ වන විට ආර්ථිකයේ සෑම අංශයක් විසින්ම අත්විදිමින් ඇත.

2.2 මුදල් සැපයුම

| | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | මාර්. 2025 | පෙබ. 2026 | මාර්. 2026 (අ) | මාර්. 2025 | පෙබ. 2026 | මාර්. 2026 (අ) |
| සංචිත මුදල් | 1,668.6 | 1,848.8 | 1,970.0 | 18.7 | 16.3 | 18.1 |
| පටු මුදල් සැපයුම (M1) | 2,039.9 | 2,319.6 | 2,413.5 | 18.6 | 19.7 | 18.3 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 13,040.9 | 14,375.8 | 14,639.8 | 11.1 | 12.1 | 12.3 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 14,777.7 | 16,276.3 | 16,585.7 | 10.9 | 11.9 | 12.2 |

2. රවටෙන්න එපා! 2025 දී රු. බිලියන 1,653.3 ක් ද, 2026 ජනවාරි - මාර්තු දක්වා රු. බි. 610.7 කින් ද ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) (තාක්ෂණික වශයෙන් මුදල් අච්චු ගැසීම) පුළුල් වී ඇත.
3. රවටෙන්න එපා! මහ බංකුව වානිජ්‍ය බැංකුවෙතින් ඩොලර් මිලදී ගැනීමට, සිය සේප්පුවල තැම්පත් කර ඇති රුපියල් නෝට්ටු භාවිත කරයි. එය මුදල් මැවීමකි (අච්චු ගැසීමකි)
4. රවටෙන්න එපා! ලංකා අර්ථික අර්බුදය ලොව පුරා යහපත් නොවන සිරස්තල මවමින් ඇත. ලංකාවේ උද්ධමනය ගැන ගෝඨාභය සමයේ දැඩි ආන්දෝලනාත්මක ප්‍රකාශ සිදු කළ Steve Hanke සිය අලුත්ම X පණිවුඩයේ ලංකාව ගැන දක්වන්නේ, INFLATION STORY = MONEY SUPPLY STORY ලෙසිනි. 2021 අර්බුදය සමයේ දී ද මහ බැංකුව Steve Hanke නිවේදන වැරදි බව නැවත නැවත ප්‍රකාශ කළ නමුත් මහා ව්‍යසනයක් වලක්වා ගත නොහැකි වූවේය.
5. රවටෙන්න එපා! මුදල් අච්චු ගැසීම ගැන වසර 15 ක් සතිපති වාර්තා සපයන රංග සිරිලාල් X පණිවුඩයකින් පවසන්නේ, Rupee under pressure with Central Bank printing money: Rupee depreciated 7.2% against the US dollar so far this year to 353.17 rupees from last weeks 327.35 & last years 299.61. @CBSL printed 309.4 billion rupees in March bringing first three months printing to Rs. 610.7 billion යනුවෙනි. මහ බැංකුව මේ ගැන කරුණු නොදක්වයි.
6. රවටෙන්න එපා! නව මුදල් නෝට්ටු මුද්‍රණය පුළුල් ලෙස දෛනික පරිහරණයට එක්වී ඇත. 2025 ජනවාරි 1 දිනට ට 'සංසරණයේ පැවති ව්‍යවහාර මුදල්' රු. මිලියන 1,351,312 ක් විය. 2026 මැයි 22 ට එය රු. මිලියන 1,655,268 දක්වා රු. මිලියන 303,956 ක් වැඩි වී ඇත. (මහ බැංකු වාර්තාව තුල වෙනස පැහැදිලිව වටහා ගත හැකිය.

| | 2026-05-15 | 2026-05-22 |
|---|---|---|
| සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් (රුපියල් මිලියන) | 1,661,265.41 | 1,655,268.00 |




7. රවටෙන්න එපා. මහ බැංකුවේ අධිපතිවරයා වානිජ්‍ය බැංකු ප්‍රධානීන් හා බලයලත් මුදල් හුවමාරු ආයතන හිමිකරුවන් කැඳවා අවිධිමත් සාකච්ඡා දෙකක දී ඩොලරයේ අගය රු. 329/ 335 සීමාවේ පවත්වා ගැනීමට උපදෙස් ලබාදී ඇත.

8. රවටෙන්න එපා! ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් අන්තර් බැංකු හුවමාරුව සඳහා ඩොලරයට රු. 330 ක පාලන මිලක් (නිල නොවන ලෙස) ප්‍රකාශයට පත් කර ඇත.

9. රැවටෙන්න එපා! ආනයනකරුවන්ට දින 90 ක් තුල මුදල් රටට ගෙන ඒමට දී තිබූ අවස්ථාව මේ වන විට දින 30 දක්වා සීමා කර ඇත.

10. රැවටෙන්න එපා! උකස් රත්‍රං හා අදාළව 70% ක උපරිම සීමාවක් මහ බැංකුව පනවා ඇත.

11. රැවටෙන්න එපා! වාහන ව්‍යාපාරය අවුල් ජාලාවක් බවට පත්ව ඇත.

12. රැවටෙන්න එපා! මැයි 24 දින අනාවැකි පළ කළ ලෙසම, අද (මැයි 26) මහ බැංකුව පොලී අනුපාත 8.75% දක්වා ඉහළ නංවා ඇත.

13. රැවටෙන්න එපා!  ඉන්ධන මිල ද එලෙසම ඉහළ නැංවීම හැර රජයට වෙනත් විකල්පයක් නැත.

14. රැවටෙන්න එපා! 2025 මාර්තු මස ඩො. මි. 6,531 ක් වූ විදේශ සංචිත 2026 අප්‍රේල් මස අවසානය වන විට වර්ධනය වී ඇත්තේ ඩොලර් මිලියන 6,759 දක්වා සොච්චමකින් පමණි.  2023 – 2024 වසරවල සෑම මසකට ඩො. මි. 175 බැගින් සංචිත වර්ධනය කර ගැනීමට මහ බැංකුව සමත් වූ නමුත්, අද විදේශ සංචිත එක තැන පල්වෙමින් ඇත.

15. රැවටෙන්න එපා! 2024 නොවැම්බර් මස රු.බිලියන 28,240.22 ක් වූ මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය 2025 වසර අවසානය වන විට රු. බිලියන 29,994.69 දක්වා රු. බිලියන 1,754.47 කින් ඉහළ ගොස් ඇත. (වසරක අඩුවීම පහත වගුවේ දැක්වේ) 16.

3.2 මධ්‍යම රජයේ නොපියවූ ණය (රු. බිලියන)(ආ)

| ශීර්ෂය | 2024 (අ)(ඇ) අවසානයට | 2025 (අ)(ඇ) අවසානයට |
|---|---|---|
| සමස්ත දේශීය ණය | 18,309.66 | 18,675.32 |
| එයින් ;   භාණ්ඩාගාර බිල්පත් | 4,061.55 | 3,136.29 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 14,079.20 | 15,427.75 |
| සමස්ත විදේශීය ණය | 10,429.04 | 11,319.36 |
| මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය | 28,738.70 | 29,994.69 |

ශ්‍රී ලංකා මහ බැංකුව ඉහතින් දැක්වූ කරුණු 15 ගැන දත්ත පාදක විග්‍රහයක් සිදු කරන තුරු කරුණු වසන් කිරීමට නිකුත් කරන පුවත්පත් නිවේදන හා සමාජ මාධ්‍ය පෝස්ට් සඳහා රැවටිය යුතු නැත.

මහ බැංකුවේ රැවටෙන්නට එපා! පළමු දැන්වීම මෙයට මාස 9 කට පෙර පළ කර ඇත. එතැන් පටන් අද දක්වා,

- මහ බැංකුව විසින් ලිපිගොනු සකස් කර මෙහෙයුම් ආරම්භ කළ ගිණුමකින් ඩො.මි. 2.5 ක් අතුරුදන්ව ඇති අතර එයින් මේ දක්වා සොයාගෙන ඇත්තේ ඩොලර් 200 ක් පමණි.
- මහ බැංකු අධීක්ෂණය යටතේ ඇති NDB බැංකුවේ රු. බිලියන 13 ක් අතුරුදන්වී රටෙන් පිටතට මුදල් රැගෙන ගොස් ඇත.
- මහ බැංකු අධීක්ෂණය යටතේ ඇති මහජන බැංකුවේ විදේශ විනිමය හුවමාරුවේ දී, රු. මිලියන 656 ක වැඩිපුර ගෙවීමක් සිදු කර ඇත.

- මහ බැංකුව අධීක්ෂණය යටතේ ඇති සම්පත් බැංකුවේ මහනුවර ශාඛාවේ දැවැන්ත වංචාවක් සිදුව ඇත.
- පිරමිඩ ජාවාරම අඛණ්ඩව ඉදිරියට යන්නේය.
- ශ්‍රී ලංකන් සමාගමේ වෙන්නායි හා මැදපෙරදිග මුදල් හුවමාරුවේ දී මුදල් අතුරුදන්වී ඇත.
- තැපැල් දෙපාර්තමේන්තුව ඇමරිකානු තැපැල් සේවය (USPS) වෙත ගෙවූ **ඇමරිකානු ඩොලර් 625,000 ක්** ද තුන්වන පාර්ශවයක් අතට පත්ව ඇත.
- මාර්ග සංවර්ධන අධිකාරියේ RDA ද්විත්ව මුදල් ගෙවීම් සිදු කරඇත.
- අස්වැසුම ලාභීන් 90,000 කට ද්විත්ව/වැඩිපුර මුදල් ගෙවා ඇත. එම මුදල් තවමත් අයකර ගැනීමට හැකිව නැත.

රැවටෙන්නට එපා!

රජිත් කීර්ති තෙන්නකෝන්

විධායක අධ්‍යක්ෂ/ශ්‍රී ලංකා මානව හිමිකම් කේන්ද්‍රය 2026 මැයි 26